පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79
ආයතනයේ නම: මුදල් කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத்தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர்: நிதி ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரசகணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79
Name of the Institution: Finance Commission

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of standing order No. 119(4)

පාර්ලිමේන්තු ශ්‍රේණි අංකය : 79

ආයතනයේ නම : මුදල් කොමිෂන් සභාව

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු		අඩුපාඩු මඟ හරවා ගැනීමට ගනු ලැබූ පියවර
01	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	01	ආයතනයේ භාවිත කල පොටෝකොපි යන්ත්‍රයක් අපහරනය කිරීමට අදාල සටහනක් සිගාස් යෙදවුමෙහි ඇතුලත් කලද, යෙදවුමෙහි දෝෂයක් මත එම සටහන අවසාන ගිණුම් සකස් කිරීම සඳහා යොදා ගන්නා භාණ්ඩාගාර ප්‍රකාශ වල සටහන් නොවීම නිසා රු.60,000 අගයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපළ පිරියත උපකරණවල වැඩියෙන් සටහන් වීම මත සහ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි සටහන් කල හරස් සටහන් අතපසුවීමකින් ධන සහ සෘණ වෙනස් වීම මත විගණන මතය ව්‍යාවනය කිරීමට හේතු වී ඇත. ඉදිරියේදී ගිණුම් සැකසීමේදී මෙවැනි දෝෂයන් පිලිබඳව අවධානය යොමු කොට ගිණුම් සැකසීමට කටයුතු යොදා ඇත.
02	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	02	මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති ව්‍යවස්ථානුකූල කාර්යභාරය විධිමත්ව ඉටුකර ඇති අතර එම කාර්යභාරය තුළින් සෘජුවම තිරසර සංවර්ධන අභිමතාර්ථ සාධනය කිරීමක් සිදු නොවන බව මූලික වැටහීමක් තිබු බැවින් හා මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන පළාත් සභාවන්හි මූල්‍ය අවශ්‍යතා තක්සේරු කිරීම, එයට අදාල නිර්දේශ ගරු ජනාධිපතිතුමා හා රජය වෙත ඉදිරිපත් කිරීම මත පදනම්ව ජාතික අයවැයෙන් පළාත් සභාවන්ට මුදල් වෙන්කිරීම හා ඒ අනුව පළාත් සභාවන් වෙත නිකුත් කරනු ලබන පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන ආයෝජන සම්බන්ධ මාර්ගෝපදේශ යටතේ තිරසාර සංවර්ධන ඉලක්ක ලභා කර ගැනීමට කටයුතු කරනු ලබන්නේ පළාත් සභාවන් විසින් වන බැවින් ආයතනික විෂය පථයට සෘජුවම අදාළ වන තිරසර අරමුණු හඳුනා ගැනීමට නොහැකි විය.
03	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	03	ඉහත 02 යටතේ ඉදිරිපත් කළ ආකාරයට අප ආයතනය තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන නොතිබු හෙයින් කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි.

04	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි	04	ඉහත 02 යටතේ ඉදිරිපත් කළ ආකාරයට අප ආයතනය තම විෂය පථය අනුව අදාල තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන නොතිබූ හෙයින් ප්‍රගතිය මැන බැලීමේ දර්ශක නියම කර නොතිබුණි.
05	සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි	05	2022 වර්ෂයේ රටතුල ඉන්ධන සැපයුම දුර්වල වීම නිසා පොදු ප්‍රවාහන සේවාවන් දුර්වල වූ බැවින් රජයේ කාර්යල සඳහා නිලධාරින් කැඳවීම සීමා කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022(11) හා රාජ්‍ය පරිපාලන ලිපි අංක PUB/ADM/SEC/07 හා 22/06/2022 දිනැතිව නිකුත් කරන ලද උපදෙස් පරිදි රජයේ නිලධාරින් කැඳවීම සීමා කෙරිණි. එමෙන්ම රටතුල අත්‍යවශය කාර්යයන් සඳහා පමණක් මුදල් වෙන්කිරීම් සිදු කෙරිණි. මෙවැනි වාතාවරණයක් තුල 2022 වර්ෂයට අදාල මානව සංවර්ධන සැලසුම් සකස් කලද අදාල පුහුණු පාඨමාලා සඳහා නිලධාරින් යොමු කිරීම අවම තත්වයකින් සිදු කෙරිණි. එමෙන්ම රටතුල පැවැති මෙම වාතාවරණය හේතුවෙන් පුහුණු පාඨමාලා පවත්වන ආයතනයන්හිදී පාඨමාලා අදාල කාල සීමාවන් තුල සිදු නොකිරිණි. නමුත් මානව සංවර්ධන සැලැස්මට යටත්ව 2023 වර්ෂයේ උක්ත අඩුපාඩුව මගහරවමින් නිලධාරින් නිසි පරිදි පුහුණු පාඨමාලා සඳහා සහභාගි කරවීමට කටයුතු කර ඇත.
06	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි	06	මෙම නිර්ණායකය ඇතුලත් කිරීමට හේතු වී ඇත්තේ මුදල් කොමිෂන් සභාවට පනතක් පිළියෙළ කිරීමට තිරණය කලද එය ක්‍රියාත්මක නොකල බැවිනි. 2022 මුල්‍ය කාර්ය සාධන විගණන වාර්තාවේ මුදල් කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය දක්වා පිළියෙළ කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ මුදල් කොමිෂන් සභා පනතක් සකස් කළ යුතු බව සඳහන් වුවත් 2019 වර්ෂයෙන් පසු වර්ෂ සඳහා පිළියෙළ කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ මුදල් කොමිෂන් සභා පනතක් සකස් කිරීමේ ක්‍රියාවලිය ඇතුලත් කර නොමැති බවට දක්වා තිබුණි. නමුත් කඩිනමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළියෙළ කිරීම පිලිබඳ කතිකාවක් ආරම්භ වීමත් සමග මුදල් කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිදු කිරීම වඩාත් යෝග්‍ය බවට කොමිෂන් සභාව අදහස් කරන ලද බැවින් පනත සකස් කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවත්වා ඇත.

සකස් කලේ:.....
එන්.ජී.ඩී.කේ. කමලනාත්
සංවර්ධන නිලධාරී

පරීක්ෂා කලේ:.....
ඩී.කේ.ඩී. කන්නන්ගර
කළමනාකරණ සේවා නිලධාරී

නිර්දේශ කලේ:.....
එස්.ඩී.සී. වන්දසිරි
ගණකාධිකාරී

සහතික කලේ:.....
එස්.කේ. කොතලාවල
ප්‍රධාන ගණකාධිකාරී

සන්ධ්‍යා කුමුදිනී කොතලාවල
ප්‍රධාන ගණකාධිකාරී
මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත, රාජගිරිය

අනුමත කලේ:.....
ඒ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්
ලේකම්

ඒ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත
රාජගිරිය.